සන්නස SANNASA

# ලියා දන්වන වග

මනසට මනා ව්‍යායාමයක් ගෙන දෙන කියවීම සම්බන්ධව අප මීට පෙර සාකච්ඡා කර ඇත්තෙමු. එහෙත් නව පරපුර ජංගම දුරකථනය හා නොයෙකුත් විද්‍යුත් සන්නිවේදන උපකරණ හරහා හරසුන්
වීඩියෝ දර්ශන හා වීඩියෝ ක්‍රීඩා වලට ඇබ්බැහි වීමෙන් මනස ශක්තිමත් කර ගැනීමට ඇති කාලය විනාශ කර ලනු පෙනේ.

දරුවන්ගේ කියවීමේ රුචිය වර්ධනය කරලීම සඳහා ඊට ගැලපෙන ඉංග්‍රීසි ලිපි පෙළක් සන්නස මාර්තු කලාපයේ සිට පල වනු ඇත.

මෙම ලිපි පෙළ සකස් කරන්නේ මානසික වර්ධනය පිලිබඳ විද්වත් මණ්ඩලයක් විසිනි.

කියවීමට පුරුදු වන දරුවා ලිවීමටද හුරු කරවීම දෙමාපියන්ගේ වගකීමකි.ඔවුන් ඊට දිරිමත් කිරීම සඳහා එම ලිපි පල කිරීමට අප පුවත්පත  හැම විටම සුදානම් .

**සංස්කරණය / Editor**
චිත්‍රාන් මොරකන්දෙ ගමගේ

අනුශාසක / **Advisor**
දෙනගම සිරිවර්ධන මහතා

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂමන් කොඩිතුවක්කු
වික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ
හර්ෂ කසුන්
ශනිල්ක නදීශාන්
ප්‍රසාද් විජයබන්දු

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by**
**Crystal D** Digital Agency
www.crystald.com.au

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Prasad : 0413 201 590**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:**
Sannasa Media Group
**BSB:** 033 137   **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.

# ආලින්දය



## අද ආලින්දයට කැඳවාගෙන එන්නේ ප්‍රවීන ගායිකා නිරෝෂා විරාජිනී

**සාකච්ඡා කළේ යුගන්ති යශෝධරා**

### විස්සයි විස්සේ කෙරෙන වැඩ කටයුතු මොනවද?

අලුත් වැඩ ටිකක් පටන් ගත්තා. සූදානමින් ඉන්නවා ගීතයක් නිකුත් කරන්න. ගීත කීපයකට රූප රචනාත් කරලා තියන්නේ. ඒ වගේම මගේ යූ ටියුබ් චැනල් එක පටන් ගන්න සූදානමින් ඉන්නවා. පහුගිය ටිකේ රියැලිටි වැඩසටහන්, පටිගත කිරීම් සහ චිත්‍රපට කීපයක ගායනා සඳහා එක් වුණා. ගෙදර වැඩයි, මගේ වැඩයි, ඔක්කොම කරන්න ඕනනේ ඉතින්. අනික මේ ටිකේ වැඩසටහන්වලට ඇඳුම් හරියට ඕන වෙන නිසා, කාලයෙන් හුඟක් වැය වෙනවා ඒ වැඩවලටත්.

### ඔබ අපූරු ගීත ගොන්නක හිමිකාරියක්?

ගීත ප්‍රමාණය ගැන ඇත්තටම මට ලොකු අදහසක් නෑ. මගේම ගීත ගත්තොත් පන්සීයකට එහා ඇති. ඊට වැඩි වුණොත් මිසක් අඩු වෙන්නේ නෑ. ඔක්කොම කලවමේ ගත්තොත්, ඒ කියන්නේ, වෙන අයට කළ ගීත, යුග ගීත, ටෙලි නාට්‍ය, චිත්‍රපට, ඔය ඔක්කොම ගැන හිතලා ගණන් හැදුවොත් නං කොහොමත් ගීත දාහකට එහා ඇති. මට මේ ටික එකතු කරගන්න බැරි එකයි ප්‍රශ්නේ. දැන් කාලය එක්ක සටනක්නේ කරන්නේ. උදේ නැඟිට්ටම දවසේ වැඩ ගොඩ ගැහිලා. මේ හැමදෙයක්ම අතරේ ගෙදර, අම්මා තාත්තා ගේ දේවල් තියෙනවා බලන්න. මට වැඩ කියලා ඒ දේවල් මඟ අරින්න බැහැ. පවුලේ ලොකු දුව විදිහට කළ යුතු දේවල් තියෙනවා. ඉතින් හරි අමාරුයි කාලය කළමනාකරණය කරගන්න. කාටහරි පවරනවා මිසක් මට ඒ වැඩේට මිඩංගු කරන්න කාලයක් නැහැ ඇත්තටම. මට මගේ ගීත ටික එකතු කරගන්න ඕන. කවදාහරි මේ ලෝකෙන් යන දවසට ඒ ටික ඒවාට ආස කරන අයට ඉතුරු කරලා යන්න ඕනනේ.